**උතුරු පළාත් සභාව - 2017**

**-------------------------------**

උතුරු පළාත් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (1SSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය නොවන සංවිධානයකින් ලැබුණු මුළු වටිනාකම රු.704,000 ක් වූ ලී බඩු හා යන්ත්‍රෝපකරණ විෂයයන් 48 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ලී බඩු හා යන්ත්‍රෝපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) එකතුව රු.මිලියන 31.22 ක් වූ ස්ථාවර තැන්පතු මත පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අත්හැරී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම හා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී එම මුදලින් අඩුවෙන් දැක්වුණි.

#### 2.2.2 නොසැසඳූ ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂය තුළ පළාත් අරමුදල් ගිණුමේ දැක්වෙන ජංගම නොවන වත්කම් වටිනාකම හා සභා ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුමේ දැක්වෙන වටිනාකම අතර රු.මිලියන 186.21 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.3 ලැබිය යුතු ගිණුම්

---------------------

වර්ෂ 01 සිට වර්ෂ 09 දක්වා කාලයක් තුළ විශ්‍රාම ගිය, තනතුරු හැර ගිය, වැඩ තහනම් කරන ලද, මිය ගිය හා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන් හැත්තෑ දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 5.34 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 අග්‍රිම ගිණුම්

----------------

2012 වර්ෂය තුළදී ගින්නෙන් විනාශ වූ කඩ සාප්පු වෙනුවෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ වෙළඳුන්ට වන්දි ගෙවීම සඳහා රු.මිලියන 06 ක අග්‍රිමයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මුදාහැර තිබුණි. ඉන් රු.මිලියන 4.872 ක මුදලක් අදාළ පළාත් පාලන ආයතන විසින් 2018 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.2.5 පොදු තැන්පත් ගිණුම්**

---

පළාත් අමාත්‍යාංශයකට හා පළාත් දෙපාර්තමේන්තු 03 කට අදාළව එකතුව රු.මිලියන 9.07 ක් වූ රඳවා ගැනීම් මුදල්, පුද්ගල තැන්පතු හා උපයෝජනය නොකළ ව්‍යාපෘති අරමුදල්, පළාත් මූල්‍ය රීති 571 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දැක්වෙන රු. මිලියන 866.96 ක් වටිනා පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකරන ලද සාක්ෂි |
|---|---|---|
| | රු.මිලියන | |
| ස්ථාවර තැන්පතු | 500.00 | එක් එක් ස්ථාවර තැන්පතු සහතික හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු පොලී මුදල යනාදී විස්තර |
| විවිධ ආදායම් | 160.61 | විස්තරාත්මක උපලේඛන හා ආදායම් ප්‍රභවය |
| උපමාන පාදක ප්‍රදාන යටතේ වියදම - පළාත් සභා ලේකම් කාර්යාලය | 198.12 | මිලදී ගත් විෂයයන් පිළිබඳ විස්තර හා බෙදාහැරීම් ලැයිස්තු |
| මිලදී ගැනුම් සඳහා ගෙවීම් | 8.23 | මුල් බිල්පත්, ලදුපත්, යාන්ත්‍රික ඉංජිනේරු සහතික, භාණ්ඩ ලැබීම් පත්, සහභාගීත්ව ලේඛනය, ආදායක අත්සන්, ලදුපත්, ඉන්වොයිසි, ඉන්වෙන්ට්‍රි සහතික, වැඩ නිමකිරීම් සහතික ආදිය |

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය | වර්ෂ 03 කට වැඩි කාලයක් හදිසි අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | සමාලෝචිත වර්ෂය සඳහා කාලීන (seasonal) ශ්‍රමිකයන් වෙනුවෙන් රු.40,000 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රේෂණය කර නොතිබුණි. |

**(ඇ) උතුරු පළාත් මූල්‍ය රීති**

----------------------------------------

| | | |
|---|---|---|
| (i) | 106 රීතිය | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව රු.මිලියන 2.31 ක ගෙවීම් කර තිබුණි. |
| (ii) | 107 රීතිය | පාසලක් හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 1.41 ක ගෙවීම් සහතික කිරීමෙන් තොරව සිදු කර තිබුණි. |
| (iii) | 159 රීතිය | යාපනය, කිලිනොච්චි හා මන්නාරම දිස්ත්‍රික්කවල ප්‍රධාන ඉංජිනේරු කාර්යාල විසින් රු.මිලියන 10.62 ක් වටිනා චෙක්පත් 17 ක් ලියා නිකුත් කිරීමෙන් තොරව තබාගෙන තිබුණි. |
| (iv) | 274.2 රීතිය | බීජ නිෂ්පාදන ගොවිපොළ හා පොල් නිෂ්පාදන ගොවිපොළ විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) | 407 රීතිය | පළාත් දෙපාර්තමේන්තු 3 ක් විසින් මුදල් හා ගබඩා සම්බන්ධ පරිපාලන වගකීම් පවරා තිබූ නිලධාරීන්ගෙන් ඇප බැඳුම්කර ලබාගෙන නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

--------------------------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ යන්ත්‍රෝපකරණ ඒකකය විසින් පාඩු හා හානි ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 510 | සමාලෝචිත වර්ෂය තුළ පශු සම්පත් ගොවිපොළෙන් උපයන ලද රු.30,000 ක් වූ ශුද්ධ ලාභය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ආදායම් ගිණුම්වලට බැරකර නොතිබුණි. |

(ඉ) 2017 නොවැම්බර් 16 දිනැති අංක 42/2017 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 7.9 වගන්තිය

(i) පාසලක විදුහල්පතිවරයකු විසින් ශිෂ්‍යයින්ට නිල ඇඳුම් මැසීම සඳහා නිල ඇඳුම් වවුචර්පත් 412 ක් ටේලර් සාප්පු 02 කට සෘජුවම ලබා දී තිබුණි.

(ii) පාසල් 02 ක විදුහල්පතිවරුන් විසින් සපත්තු සඳහා වවුචර්පත් 816 ක් සැපයුම්කරුවකුට සෘජුවම ලබා දී තිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක් තුළ රැස්කරන ලද මුළු ආදායම අයවැයගත ආදායමට සාපේක්ෂව පහත දැක්වේ.

| වර්ෂය | බදු ආදායම | | බදු නොවන ආදායම | |
|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | අයවැයගත | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2013 | 1,900.00 | 1,410.33 | 188.00 | 121.88 |
| 2014 | 1,809.00 | 1,754.66 | 140.00 | 111.80 |
| 2015 | 2,225.30 | 2,074.51 | 97.70 | 157.36 |
| 2016 | 2,273.00 | 2,744.99 | 157.00 | 370.20 |
| 2017 | 3,300.70 | 3,125.54 | 177.00 | 458.08 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

පළාත් පාලන ආයතන 34 කට අදාළව මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල්, වරිපනම් හා බදු, බදු කුලී, දේපල බදු ආදී එකතුව රු.මිලියන 1,637.22 ක් වූ හිඟහිටි ආදායම් 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.මිලියන 2,668.29 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.මිලියන 23.18 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 2,691.47 ක වර්ධනයක් දැක්වුණි. එම වර්ධනය සඳහා හේතුවූයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 2,734.15 කින් රජයේ ප්‍රදාන වැඩිවීම හා රු.මිලියන 227.60 කින් බදු ආදායම වැඩිවීමයි.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු.මිලියන 24,044.82 ක් වූ අතර ඉන් රු.මිලියන 20,990 ක මුදලක් පුනරාවර්තන වියදම් සඳහා දරා තිබුණි. එය මුළු වියදමින් සියයට 87 කින් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමින් රු.මිලියන 15,942 ක මුදලක් පෞද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 76 කින් නියෝජනය විය. ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මිලියන 19,312 ක් වූ අතර එය මුළු වියදමෙන් සියයට 82 ක් විය. විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | | | 2016 | | |
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය (හිතකර/ අහිතකර) | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය (හිතකර/ අහිතකර) |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **ආදායම** | | | | | | |
| බදු ආදායම හා බදු නොවන ආදායම | 3,478 | 3,584 | 106 | 2,430 | 3,115 | 685 |
| රජයේ ප්‍රදාන | 23,853 | 23,130 | (723) | 22,912 | 20,415 | (2,497) |
| මුළු ආදායම | 27,331 | 26,714 | (617 | 25,342 | 23,530 | (1,812) |
| **වියදම** | | | | | | |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 15,863 | 15,942 | (79) | 14,818 | 14,807 | 11 |
| වෙනත් | 4,712 | 5,048 | (336) | 4,548 | 4,505 | 43 |
| උප එකතුව | 20,575 | 20,990 | (415) | 19,366 | 19,312 | 54 |
| ප්‍රාග්ධන වියදම | 6,776 | 3,055 | 3,721 | 6,184 | 4,241 | 1,943 |
| මුළු වියදම | 27,351 | 24,045 | 3,306 | 25,550 | 23,553 | 1,997 |

## 5. වාණිජ අත්තිකාරම් ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

### 5.1 පශු සම්පත් ගොවිපොළ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ජනවාරි 01 දිනට ගවයින් 22 කගේ වටිනාකම හා 2017 දෙසැම්බර් 31 දිනට ගවයින් 41 කගේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය අඩුවෙන් දැක්වුණි.

(ආ) අනිච්චන්කුලම් ප්‍රජනන ගොවිපොළහි කාර්යයන් සඳහා භාවිතා කරන ලද යන්ත්‍ර හා උපකරණ 16 ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා යන්ත්‍ර හා උපකරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) එකතුව රු.168,745 ක් වූ අච්චුවේළි ගොවිපොළේ අවසාන තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.168,745 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 5.2 යන්ත්‍රෝපකරණ ඒකකය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 ජුලි 13 න් පසුව අත්කර ගන්නා ලද යන්ත්‍රෝපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව විවිධ ක්ෂය කිරීම් ක්‍රම යොදා ගනිමින් ක්ෂය කර තිබුණි.

(ii) එකතුව රු.මිලියන 150.82 ක් වටිනාකම වූ යන්ත්‍රෝපකරණ 13 ක් 2015 හා 2016 වර්ෂ සඳහා පිළිවෙලින් සියයට 5 හා සියයට 12.5 යන අනුපාතවලට සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කිරීම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 26.39 ක් වූ සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි. තවද, සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනයෙහි කරන ලද මෙම ගැලපීම් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 6. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්යසාධනය

#### 6.1.1 අරමුදල් උපයෝජනය

පළාත් සභාවේ සංවර්ධන වැඩ සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් හා ඒ පිළිබඳ දරන ලද තථ්‍ය වියදම පහත දැක්වේ.

| ප්‍රදාන/ ව්‍යාපෘති විස්තර | වෙන්කිරීම | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 4,147.28 | 3,620.50 | 526.78 |
| උපමාන පාදක ප්‍රදාන | 589.20 | 589.20 | - |
| දැනුම් කේන්ද්‍රයක පදනම ලෙස පාසැල් අධ්‍යාපනය පරිවර්තනය කිරීම | 315.00 | 252.00 | 63.00 |
| සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය | 360.00 | 360.00 | - |
| කයිතඩි ගොඩනැගිල්ල ඉදිකිරීම | 16.50 | 16.50 | - |
| උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය | 212.31 | 207.16 | 5.15 |
| උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයනය) | 536.42 | 174.01 | 362.41 |
| ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 1,077.00 | 685.37 | 391.63 |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 909.00 | 809.00 | 100.00 |
| එකතුව | 8,162.71 | 6,713.74 | 1,448.97 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවල සඳහන් පරිදි අයවැය මාර්ගෝපදේශ, පළාත් මූල්‍ය රීති හා පළාතේ අවශ්‍යතාවයන් සැලකීමෙන් තොරව අයවැය යෝජනා පිළියෙල කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල වියදම් වැය ශීර්ෂ 23 ක් යටතේ කරන ලද එකතුව රු.මිලියන 1,448.97 ක ප්‍රතිපාදන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු 04 ක් විසින් අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන නොමැතිව එකතුව රු.මිලියන 132.22 ක් වූ ප්‍රාග්ධන වියදම වැය කර තිබුණි. පසුව, මෙම වියදම අධිහාර ගිණුමක් මඟින් වර්ෂය අවසානයේදී නියමානුකූල කර තිබුණි.

(ඇ) තත් කාර්ය පදනම මත වැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වැය විෂය සංකේත 163 ක් යටතේ කරන ලද එකතුව රු.මිලියන 1,212.37 ක් වූ මූල්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශ 02 ක් හා දෙපාර්තමේන්තු 10 ක් විසින් උපයෝජනය කර නොතිබුණි.

## 6.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

චෙක් පිළිපත්වලට අනුව, රු.718,000 ක් වටිනා චෙක්පත් 27 ක් විවිධ සැපයුම්කරුවන්ගේ නම්වලට ලියා තිබුණි. කෙසේ වුවද, පාසල් 02 ක ගුරුවරුන් දෙදෙනෙකු විසින් හා එක් ගුරුවරියකගේ ස්වාමි පුරුෂයා විසින් මෙම චෙක්පත් මුදල් කරගෙන තිබුණි.

**6.3 දෘශ්‍ය අක්‍රමිකතා**

---------------------

විධිමත් ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව විදුහල්පතිවරයෙකු විසින් පාසලක ආපන ශාලාව කුලියට ලබා දී තිබූ අතර 2014 ජනවාරි සිට 2018 ජුනි දක්වා කාලය තුළ ලැබී තිබුණු එකතුව රු.43,100 ක කුලී මුදල පාසල් සංවර්ධන සමිතියේ ගිණුම්වලට ගිණුම්ගත කර නොතිබුණි.

**6.4 කළමනාකරණ දුර්වලතා**

----------------------------

මන්නාරම අධ්‍යාපන කලාපයේ ගුරු භවතුන් 266 ක් වයඹ පළාතට (පුත්තලම දිස්ත්‍රික්කය) අනුයුක්ත කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 82.86 ක් වූ ඔවුන්ගේ වැටුප් හා දීමනා උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර එම මුදල් අදාළ පාර්ශවයන්ගෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට 2018 ඔක්තෝබර් 29 දින වන විටත් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

**6.5 වැඩිපුර ගෙවීම්**

------------------

ඉදිකිරීම් කාර්යයන් 14 කට අදාළව කරන ලද තථ්‍ය වැඩ ප්‍රමාණය ගෙවීම් බිල්පත්වල සඳහන් වැඩ වටිනාකම හා සැසඳීමේදී අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තු 04 ක් හා පාසල් 04 ක් විසින් රු.1,053,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**6.6 වත්කම් කළමනාකරණය**

------------------------------

**6.6.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්**

------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයකට, දෙපාර්තමේන්තු 07 කට හා පළාත් පාලන ආයතන 15 කට අයත් රු.මිලියන 477.877 ක් වටිනා භෞතික සම්පත් මාස 10 සිට වර්ෂ 09 දක්වා කාල පරිච්ඡේදයක් තුළ නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව තිබෙන්නට ඉඩහැර තිබුණි.

(ආ) උතුරු පළාතේ පාසල් 56 ක් විවිධ හේතූන් මත වසා දමා තිබුණද එම පාසල්වල ඉඩම්, ගොඩනැගිලි, ලී බඩු හා වෙනත් වත්කම් යනාදී වත්කම් වර්ෂ 05 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

**6.6.2 ගබඩා විෂයයන් පිළිබඳ වාර්ෂික සත්‍යාපනය**

------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.මිලියන 212.35 ක් වූ වත්කම් 22 ක් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

(ආ) අත්යන්ත්‍ර රෙදිපිළි විෂයයන් 396 ක ඌනතා වටිනාකම, විධිමත් පියවර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් පොත්වලින් ලියා හැර තිබුණි.

(ඈ) උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට 2015 හා 2016 වර්ෂ තුළදී ඔවුන්ගේ පුද්ගලික පරිහරණය සඳහා බෙදා හරින ලද රු.මිලියන 16.25 ක් වටිනා උපකරණ භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

### 6.6.3 අත් යන්ත්‍ර රෙදිපිළි මධ්‍යස්ථානවලට අයත් නොවන දේපල

---------------------------------------------------------------------

අත් යන්ත්‍ර රෙදිපිළි මධ්‍යස්ථාන විසින් දේපල 17 ක් උපයෝජනය කරන ලද නමුත්, පසුගිය වර්ෂ 5 තුළදී එම දේපලවල අයිතිය එම මධ්‍යස්ථානවලට පවරා නොතිබුණි.

### 6.7 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 10 කට වැඩි කාලයක් පළාත් සභාවේ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්වල දැක්වෙන රු.මිලියන 39.316 ක් වටිනා විෂයයන් 19 ක හානි වීම පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ආ) විධිමත් පියවර ගැනීමෙන් තොරව රු.මිලියන 16.48 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ විෂයයන් යාපනයේ ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශ ගබඩාවල ගබඩා කර තිබුණි.

(ඇ) බර වාහන පැදවීමේ බලපත්‍ර නොමැති රියැදුරකු විසින් 2017 මාර්තු 28 දින අනතුරක් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 1.54 ක පාඩුවක් දරා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් අනතුරට ලක් වූ වාහනයක් රු.මිලියන 4.29 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් මාස 18 කට වැඩි කාලයක් පියවර ගෙන නොතිබුණි.

(ඉ) පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.184,000 ක් වටිනා පශු සම්පත් හානිය ගිණුම් පොත්වලින් ලියා හැර තිබුණි.

(ඊ) ඉන්වෙන්ට්‍රි විෂයයන් 07 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ නමුත්, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 10 කට වැඩි කාලයක් මෙම හානිය පිළිබඳ අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) පැරණි කොන්ත්‍රාත්කරු විසින් පාසල් ගොඩනැගිලි 2 ක වැඩ සම්පූර්ණ කර නොතිබුණු අතර ඒ සඳහා නැවත ලංසු කැඳවීම හේතුවෙන් රු.මිලියන 2.23 ක පාඩුවක් සිදු වී තිබුණි.

### 6.8 ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන්

------------------------------------

ඉදිකිරීම් වැඩ 34 ක් නිම කිරීමේ ප්‍රමාදය සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 53.13 ක ප්‍රමාණ කළ අලාභ කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

## 6.9 අත්හැර දැමූ ව්‍යාපෘති

පාසල් 3 කට අදාළව එකතුව රු.මිලියන 32.66 ක් වූ ප්‍රාග්ධන වැඩ 3 ක් විවිධ හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළ අත්හැර දමා තිබුණි.

## 6.10 ප්‍රාග්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

මුළු වටිනාකම රු.මිලියන 394.09 ක් වූ ප්‍රාග්ධන වැඩ 37 ක් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, එම කාර්යයන් 2018 ජුනි 21 දිනට කාලය දීර්ඝ කිරීමෙන් පසුවත් නිම කර නොතිබුණි.

## 6.11 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලයට අදාළ තොරතුරු පහත දැක්වේ.

### 6.11.1 පාසල් කාර්ය මණ්ඩලය

| දිස්ත්‍රික්කය | අනුමත කාර්ය මණ්ඩලය | | තථ්‍ය කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු | |
|---|---|---|---|---|---|---|
| | විදුහල්පතිවරුන් | ගුරුභවතුන් | විදුහල්පතිවරුන් | ගුරුභවතුන් | විදුහල්පතිවරුන් | ගුරුභවතුන් |
| යාපනය | 551 | 8,839 | 524 | 7,881 | 27 | 958 |
| කිලිනොච්චි | 147 | 2,294 | 92 | 1,871 | 55 | 423 |
| මන්නාරම | 158 | 2,258 | 92 | 1,778 | 66 | 480 |
| වවුනියා | 215 | 2,770 | 194 | 2,330 | 21 | 440 |
| මුලතිව් | 149 | 2,277 | 90 | 1,820 | 59 | 457 |
| එකතුව | 1,220 | 18,438 | 992 | 15,680 | 228 | 2,758 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික්ක 5 ක ගුරු භවතුන් 2,758 ක පුරප්පාඩු හා විදුහල්පති තනතුරු 228 ක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 6.11.2 සෞඛ්‍ය අංශ කාර්යමණ්ඩලය

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය (PDHS) හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල (RDHS) සෞඛ්‍ය නිලධාරීන්ගේ අතිරික්තයන් හා පුරප්පාඩු නිරීක්ෂණය විය. කෙසේ වුවද, පළාත තුළ සිටින අතිරික්ත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශේෂඥ වෛද්‍යවරුන් සඳහා 119 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් පළාත තුළ විශේෂඥ වෛද්‍යවරුන් 63 දෙනෙකු පමණක් දැනට සේවයේ යෙදී සිටින අතර යාපනය හා මුලතිව් දිස්ත්‍රික්කවල රෝහල් කිහිපයක විශේෂඥ වෛද්‍යවරු සඳහා පුරප්පාඩු පැවතුණි.

(ආ) වෛද්‍ය නිලධාරීන් සඳහා 723 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් වෛද්‍ය නිලධාරීන් 600 දෙනෙකු පමණක් දැනට සේවයේ යෙදී සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස පර්යන්ත රෝහල් කිහිපයක් වෛද්‍ය නිලධාරියෙකු නොමැතිව ක්‍රියාත්මකව තිබුණි.

(ඇ) ප්‍රධාන රෝහල්වල හෙද නිලධාරී ඌනතාවයන් රාශියක් නිරීක්ෂණය විය. අනුමත 826 ක් වූ කාර්ය මණ්ඩලයෙන් හෙද නිලධාරීන් 716 ක් පමණක් පළාත තුළ සේවය කරමින් තිබුණි.

(ඈ) දන්ත ශෛල්‍ය වෛද්‍යවරු සඳහා අනුමත 92 ක් වූ කාර්ය මණ්ඩලයෙන් දැනට දන්ත ශෛල්‍ය වෛද්‍යවරු 65 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත තුළ පැවති පුරප්පාඩු 17 ක් මෙතෙක් පුරවා නොතිබුණි.

## 6.12 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 6.12.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**(අ) පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන**

පළාත් සභා අරමුදල් ගිණුමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 27 දින දීය.

**(ආ) වෙනත් ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ වෙනත් ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුම් වර්ගය | 2017 වර්ෂය සඳහා | |
|---|---|---|
| | විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කරන ලද මුළු ගිණුම් සංඛ්‍යාව |
| විසර්ජන ගිණුම් | 33 | 33 |
| ආදායම් ගිණුම් | 01 | 01 |
| පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 32 | 32 |
| වාණිජ අත්තිකාරම් ගිණුම් | 04 | 04 |
| අරමුදල් ගිණුම් | 01 | 01 |
| | 71 | 71 |

### 6.12.2 පිළිතුරු නොලත් විගණන විමසුම්

ප්‍රධාන ලේකම්, ලේකම් කාර්යාලයට සහ අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට නිකුත් කරන ලද විගණන විමසුම් 3 කට අදාළ පිළිතුරු වර්ෂ 2 කට වැඩි කාලයක් ඉදිරිපත් කර නොතිබුණි.

### 6.12.3 පෙර විගණන වාර්තා මඟින් පෙන්වා දෙන ලද නොවිසඳුණු කරුණු

| වර්ෂය | ඡේද අංකය | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| 2016 | 6.1(ආ) | සුළං ටර්බයින සවි කිරීම මඟින් විදුලිබල උත්පාදන පිරියත ස්ථාපිත කිරීම. |
| 2016 | 6.4 | සමුපකාර දෙපාර්තමේන්තුව සතුව පුන්තෝඩම්, වවුනියා හි ගොඩනැගිලි පහසුකම් තිබුණද වර්ෂ 7 කට වැඩි කාලයක් කුලී සඳහා රු.මිලියන 2.7 ක මුදලක් වැයකර තිබුණි. |
| 2016 | 6.5(v) | රේඛීය අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන සංවිධාන විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන කිහිපයක අයිතිය ලබා ගැනීම සඳහා පළාත් සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 2016 | 6.10.2 (iv) | කොන්ත්‍රාත්කරුවන්ගේ එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකවල වලංගුභාවය තහවුරු කරගැනීමෙන් තොරව ප්‍රාදේශීය සභා විසින් රු.මිලියන 3.16 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම අංක ක්‍රියාත්මක නොවන අංක බව පසුව අනාවරණය විය. |

## 7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පද්ධති | දුර්වලතා |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉලක්කගත කාල පරිච්ඡේදයක් තුළ සම්පූර්ණ නොකිරීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කටයුතු නොකිරීම. |
| (ඇ) | වත්කම් උපයෝජනය | බොහෝ ගොඩනැගිලි හා උපකරණ අරමුණු කළ කාර්යයන් සඳහා භාවිතා නොකිරීම. |
| (ඈ) | අයවැය | දුර්වල මූල්‍ය පාලනය |